# 11 ශ්‍රේණිය

## ඉතිහාසය

කියවීම් ද්‍රව්‍යය

## 1.1 ඒකකය

## කාර්මික විප්ලවයේ ආරම්භය හා එහි ප්‍රබෝධය



## කාර්මික විප්ලවය

# 18 වන සියවසේ බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය

## බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු

- බ්‍රිතාන්‍ය දේශපාලන ස්ථාවරත්වය

  ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යාපාරික කටයුතු වල යෙදීමට නිදහස ,උපකාරය හා බදු සහන ආදිය පාර්ලිමේන්තුව මගින් ලැබීම.

- මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් සිටීම

  16 වන සියවසේ සිට යුරෝපයේ වෙළඳ හා වාණෙඳ හා වාණිජ කටයුතු දියුණු වූ අතර 18 වන ශත වර්ෂය ආරම්භ වන විට යුරෝපා රටවල් අතරින් පෘතුගාලය, ස්පාඤ්ඤය , ඕලන්දය , ප්‍රංශය වැනි රටවල් වලට වඩා එංගලන්තය ඉදිරියට පැමිණ තිබුණි . මෙම නිසා කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් එරට බිහි විය .

- අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම

  බ්‍රිතාන්‍ය තුළ ද කාර්මික නිෂ්පාදන වලට අවශ්‍ය ගල් අඟුරු වැනි අමුද්‍රව්‍ය බහුල ප්‍රදේශ, එයට උදාහරණ : දකුණු වේල්ස් , යෝක්ෂයර් හා ලැන්කැෂයර් එමෙන්ම බ්‍රිතාන්‍යයට අයිති යටත් විජිතවලින් ද අමුද්‍රව්‍ය පහසුවෙන් ලබා ගැනීමට හැකි විය. උදාහරණ : ඉන්දියාව වැනි රටවල්

- යටත් විජිත හා වෙළඳාමේ වර්ධනය

  සමකාලීන ප්‍රංශය වැනි රටවල ද විශාල ජනගහනයක් ජනගහනයක් සිටි නමුත් බ්‍රිතාන්‍යයට සාපේක්ෂව එම රටවල වෙළඳ දියුණුව සීමිත වී තිබුණි.බ්‍රිතාන්‍යය විවිධ වාණිජ නීති මගින් සිය යටත් විජිත වලට බාහිර රටවල් සමග වෙළඳ සබඳතා පවත්වා ගැනීමට තිබූ ඉඩකඩ බොහෝ දුරට අහුරා තිබිණි. මේ නිසා බ්‍රිතාන්‍ය යටත් විජිත වලට අවශ්‍ය භාණ්ඩ බ්‍රිතාන්‍යයෙන් ආනයනය කිරීමට සිදුවීමෙන් එරට භාණ්ඩ වලට යටත් විජිතවලින් හොඳ ඉල්ලුමක් ඇති වීම නිසා වෙළඳාමේ වර්ධනයට හේතු විය .

- වැඩවසම් ප්‍රවේණි ක්‍රමය

යුරෝපය තුල 14 වන සියවස පමණ වන තෙක් වැඩ වැඩවසම් ප්‍රවේණි ක්‍රමයක් ක්‍රියාත්මක විය.එහි රදළ ප්‍රධානීන්ගේ පාලනයට නතු වූ ප්‍රවේණිදාසයන් බොහෝ දුක් පීඩා විඳිමින් රදලයන් විසින් සපයා දුන් ඉඩම් වල (ප්‍රවේණි වල ) සේවය කරන ලදී . 14 වන සියවසෙන් පසු ඇතිවූ පුනරුදය මගින් වැඩවසම් ප්‍රවේණි ක්‍රමය බිඳ වැටිණි. 14 වන 15 සියවස් වල යුරෝපයේ ඇති ඇති වූ පුනරුදයේ නිසා විද්‍යාත්මක දියුණුවේ පුළුල් වීමක් ඇතිවිය.

- ආකල්ප හා නව අදහස් ප්‍රචලිත වීම

සෙසු රටවල මෙන් නොව බ්‍රිතාන්‍යයේ සමාජ තරාතිරම කුමක් වුවත් හැකියාව ඇති පුද්ගලයන්ට ධනය උපයාගත හැකි පසුබිමක් තිබිණ. ආකල්පමය වශයෙන් එරට පැවති පැවති මෙබඳු නිදහස් සමාජ පසුබිම නව අදහස් ප්‍රචලිත වීමට හේතු හේතුවූ අතර හේතු වූ අතර එය කාර්මික ක්ෂේත්‍රයේ දියුණුවට හිතකර විය.

- බ්‍රිතාන්‍ය තුළ කාර්මික විප්ලවයට සුදුසු පසුබිමක් පැවැතීම

යුරෝපයේ අනෙක් රටවල් හා සසඳන විට බ්‍රිතාන්‍ය තුළ කාර්මික විප්ලවය සඳහා සුදුසු පසුබිමක් පැවතිණි . කුඩා දිවයිනක් වීම , අභ්‍යන්තර වශයෙන් රට පුරා විහිදුන පොදු වෙළඳපලක් ගොඩනගා ගැනීමට හැකිවීම , නිෂ්පාදන භාණ්ඩ සඳහා ඉහළ මිලක් ලබාගත හැකිවීම , ලන්ඩන් නගරය අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය, නිෂ්පාදන ද්‍රව්‍ය බෙදා හරින බෙදාහරින මධ්‍යස්ථානයක් වීම යන සාධක රැසක් බ්‍රිතාන්‍ය පැවතීම නිසා සෙසු රටවලට වඩා කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍ර ඉදිරියට පැමිණීමට බ්‍රිතාන්‍යට හැකිවිය .